www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# භූ-දේශපාලනික ශක්තිය උරගා බලන ශාන්ත පීටර්ස්බර්ග්හි ජී-8 සමුලුව

## G8 summit: Geopolitical trial of strength in St. Petersburg

**පීටර් ශ්වාර්ස් විසිනි**
**2006 ජුලි 13**

"ගිනිඋදුන වටා සාකච්ඡාව" සඳහා පැරිසියට නුදුරු රැම්බෝලෙට් හි දී 1975 වසරෙහි පැවති එක්සත් ජනපදය, ප්‍රන්සය, මහා බ්‍රිතාන්‍යය, ජර්මනිය, ඉතාලිය හා ජපානයේ රාජ්‍යායතනයන්ගේ හමුවෙන් පසුව, රුසියාව හා කැනඩාව ද එක් කරගත් ජී-8 ලෙස හඳුන්වන සමුලුවේ වාර්ෂික රැස්වීම ජාත්‍යන්තර සංසිද්ධියක් බවට පත්ව තිබේ. විවිධ ඇමතිවරුන් අතර සාකච්ඡා මාලාවකින් වට කරනු ලබන සමුලුව, මාස ගනනාවක පටන් නිලධාරීන් හමුදාවක් විසින් සැලසුම් කොට සූදානම් කෙරේ.

කාලය හා ශ්‍රමය අතින් මෙයට දැවැන්ත වියදමක් දරන්නේ වුවත්, මෙම සමුලු බොහෝ කොටම සාමාන්‍යයෙන් ගන්නේ සංකේතවත් ස්වභාවයකි. පොදුවේ, ප්‍රතිඵලය කල් තබාම තීරනය වන අතර වැදගත් තීන්දු ගනු ලබන්නේ කලාතුරකිනි. එසේ වුවත් සමුලු, ජාත්‍යන්තර සම්බන්ධතාවන්ගේ ස්වභාවය දෙස එබී බැලීමට අවස්ථාවක් සලසයි.

ජුලි 15 සිට 17 දක්වා, රුසියාවේ ශාන්ත පීටර්ස්බර්ග් නගරයෙහි පැවැත්වෙන ජී-8 සමුලුව ආරම්භයේ දී සැලසුම් කරනු ලැබුවේ, ප්‍රධාන ධනේශ්වර කාර්මික රටවල සමාජශාලාවට රුසියාව, පූර්න වසයෙන් එක් කර ගැනීම සංකේතවත් කිරීමටය. එහෙත්, රැස්වීමත්, ඊට පෙර පූර්වයෙන් පැවති කඹඇදීමත්, ජාත්‍යන්තර සම්බන්ධතාවන් මත ක්‍රියාත්මක තියුනු ආතතීන් හෙලිදරව් කිරීමට උදව් විය.

විශේෂිතව, සෝවියට් සංගමය බිඳ වැටීමෙන් පසුව, එක්සත් ජනපදය හා රුසියාව අතර සම්බන්ධතාවය එහි පහල ම ලක්ෂයට ලඟා වී ඇත. සෙනෙට් සභික ජෝන් මැකේන් හා ජෝසෆ් ලිබර්මාන් වැනි සමහර එක්සත් ජනපද දේශපාලනඥයන්, ශාන්ත පීටර්ස්බර්ග් සමුලුව වර්ජනය කරන ලෙස කැඳවුම් කිරීම තෙක් දුරකට ගමන් කර තිබේ.

කරුනු දෙකක්, ගැටුමේ හදවතෙහි ම පිහිටියේ ය.

පලමු වැන්න, "ගෝලීය බල ශක්ති ආරක්ෂාව" යන සිරස්තලය යටතේ, නිල න්‍යාය පත්‍රයේ උඩින් ම තිබුනු කාරනය යි. විසි එක්වැනි සියවසේ, භූ-දේශපාලනික තුලනයෙහි ප්‍රධාන සාධකයක් බවට පත්ව තිබෙන ජාත්‍යන්තර බල ශක්ති සංචිත හා ප්‍රවාහන මාර්ගයන් පාලනය කිරීම පරදුවට තැබී ඇත.

ලෝකයේ ප්‍රමුඛ තෙල් හා ගෑස් අපනයනකරුවන්ගෙන් එක් අයෙකු වන රුසියාව සතුව, ගවේශනය නොකල දැවැන්ත ගෑස් සංචිත ද තිබේ. මෙම සාධකය ප්‍රයෝජනයට ගනිමින් ඇය, ලෝක බලවතෙකු ලෙස එහි තත්වය ශක්තිමත් කර ගැනීමටත්, ගෝලීය රාජ්‍යාන්තර නායකත්වය සඳහා ඇමරිකාවේ තල්ලුව වලකා ලීමේ ජාත්‍යන්තර සන්ධානයක් ගොඩ නැගීමටත් උත්සාහ කරයි. කුමන වියදමක් දරා හෝ වලක්වා ගැනීමට වොෂිංටනය උත්සුක වෙන මෙම ප්‍රතිපත්තිය, රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් විසින් පැහැදිලි කර ඇත්තේ "බහු ධ්‍රැවයන්ගේ ලෝක පර්යාය" වර්ධනය කිරීම ලෙස ය.

දෙවැනි කාරනය වන ඉරානය කෙරෙහි ආකල්පය, පලමුවැන්න සමග සමීප ලෙස බැඳී ඇත. නිල න්‍යාය පත්‍රයෙහි ඇතුලත් නොවුන ද, එය සමුලුව තුල ප්‍රමුඛ ක්‍රියා කලාපයක් ඉටු කරනු ඇත.

ගනු දෙනුවක හැකියාවන් පිලිබඳ බොහෝ ඇඟවීම් දක්නට ලැබේ. ටෙහෙරානයට එරෙහි සම්බාධක පැනවීමට රුසියාව එකඟවීමට සූදානම් නම්, බොහෝ කරුනු මත රුසියාව කෙරෙහි දක්වන එක්සත් ජනපදයේ දැඩි පිලිවෙත ලිහිල් වනු ඇත. ලෝක වෙලඳ සංවිධානයට බැඳීමේ හා බෙහෙවින් ලාභදායී ව්‍යාපාරයක් වන, ජාත්‍යන්තර විකිරනශීලී අපද්‍රව්‍ය ගබඩා කිරීමට හැකිවන ආකාරයේ න්‍යෂ්ටික ගිවිසුමකට එලඹීමේ රුසියානු උත්සාහයන් ද ඒ අතර වේ.

එන්ට එන්ටම ආඥාදායකත්වයට නැඹුරුවන පුටින්ගේ පාලනය, පරිසරය සුරැකීමේ දී සාපේක්ෂව පරිසර හිතකාමී මාධ්‍යයන් ලෙස ස්වාභාවික ගෑස් හා න්‍යෂ්ටික බල ශක්තිය හුවා දැක්වීමේ රුසියාවේ නවතම නැඹුරුව හා මෑත කාලයේ මොස්කව්හි පැවැත්වූ, වතිකානුව, රුසියානු සාධර්මික පල්ලිය හා ඉරාන මුල්ලාවරුන් නියෝජනය කල ආගමික නායකයන්ගේ සමුලුව වැනි, සමුලුවට සූදානම් වීමේ දී මාධ්‍ය සිරස්තලය බවට පත් වූ, මතභේදයට තුඩු දුන් විවිධාකාර

දෙවැනිගනයේ කරුනු සියල්ල, භූ-දේශපාලනික ශක්තිය උරගා බැලීමේ සංරචකයක් බවට පත්ව තිබේ.

යුරෝපය මේ පිලිබඳ අභිලාෂයන්ගෙන් විනිර්මුක්ත නොවුනත් ඔවුන්ට, මෙම ශක්තිය උරගා බැලීමේ පරීක්ෂනය තුල ස්වාධීන ක්‍රියා කලාපයක් ඉටු කිරීමේ දී, තමන්ගේ සහකරුවන් අතර අවශ්‍ය ඒකමතියක් නොමැත. සමුලුවට සහභාගිවන නායකයන් අතරින් හරි අඩක් ම යුරෝපීයන් වුව ද, බොහෝ ප්‍රශ්නවල දී යුරෝපය එක්සත් ජනපදයට සහයෝගය දක්වයි. මහා බ්‍රිතාන්‍යය හැර අවශේෂ යුරෝපය, මැද පෙරදිග හා මධ්‍යම ආසියාවේ ආධිපත්‍යය සඳහා ඇමරිකාවේ ව්‍යායාමය දෙස බලන්නේ අවිශ්වාසයෙනි. එහෙත් ඔවුන්, බල ශක්ති නිෂ්පාදන ජාතීන්, පාරිභෝගික රටවල් මත තම තත්වය ශක්තිමත් කර ගැනීමේ උත්සාහයේ දී රුසියානු ක්‍රියා කලාපය පිලිබඳව ඊටත් වඩා සැක පල කරති. යුරෝපය, එක්සත් ජනපදයටත් වඩා, බලශක්ති ආනයනයන් මත යැපෙයි.

## බලශක්ති ආරක්ෂනය

බොරිස් යෙල්ට්සින් අවධියේ දී ආර්ථික හා දේශපාලන පරිහානියේ ලක්ෂයක් කරා ලඟාවී සිටි රුසියාව, පසු ගිය වසර කිහිපයේ දී සැලකිය යුතු ආර්ථික පුනරාගමනයක් අත් විඳිමින් සිටියි. 1999 පටන් ආර්ථිකය, වාර්ෂිකව සියයට 6ක අනුපාතයකින් වර්ධනය වී ඇත. රුසියානු කොටස් වෙලඳපොල 2001 පටන් 11 ගුනයකින් ඉහල නැගි අතර දැන් එහි අගය ඩොලර් බිලියන 621 කි. මෙම වසරේ දල දේශීය නිෂ්පාදිතය බිලියන 900කට ලඟා වනු ඇතැයි අපේක්ෂිත ය.

මෙම සංඛ්‍යාවන් පලමු හා ප්‍රධානකොට ම, 2002 පටන් තෙගුනයකින් ඉහල නැඟි තෙල් හා ගෑස් මිලෙහි ප්‍රතිඵලයකි. රුසියාව, සව්දි අරාබියට පසුව, ලෝකයේ දෙවැනි විශාලතම තෙල් නිෂ්පාදකයා වන අතර, ජාත්‍යන්තර ස්වාභාවික ගෑස් සංචිතවලින් සියයට හැට පහක් ම පාලනය කරයි. දැනට රුසියාව, ලෝකයේ තෙල්වලින් නමයෙන් එකක් ද ස්වාභාවික ගෑස්වලින් පහෙන් එකක් ද සපයයි.

ලෝක බලවතෙකු ලෙස රුසියාවේ තත්වය යලි ගොඩනගාගැනීමටත් ශක්තිමත් කර ගැනීමටත් පදනම මෙය ලෙස පුටින් ආන්ඩුව සලකනු ලබයි. ගෑස්ප්‍රොම් ගෑස් ඒකාධිකාරයත්, අර්ධ ජනසතු තෙල් සමාගමුත් හරහා බලශක්ති ක්ෂේත්‍රය සිය පාලනයට නතු කර ගැනීමට ආන්ඩුව ක්‍රමානුකූලව ක්‍රියා කරමින් සිටියි. බල ශක්ති නිෂ්පාදකයෙක් ලෙස රුසියාවේ තත්වය, සෝවියට් සංගමය බිඳ වැටීමෙන් පසුව නිදහස ලත් ප්‍රදේශ මත සිය බලපෑම යලි පිහිටුවා ගැනීමටත්, නව ජාත්‍යන්තර සන්ධානයන් ගොඩනගාගැනීමටත්, ආන්ඩුව යොදා ගෙන තිබේ. වොෂින්ටනයහා යුරෝපය මෙම වර්ධනයට එකහෙලා විරෝධය දක්වයි.

මහා තෙල් ව්‍යාපාරික මිහායෙල් කෝඩෝරොව්ස්කි අත් අඩංගුවට ගැනීමට ත්, ඔහුගේ යූකෝස් තෙල් සමාගම බිඳ දැමීමටත් පැන නැගි විරෝධය පිටුපස පැවතියේ මෙයයි. දෙපාර්ශ්වයේ ම තර්කයන් වංචනික ය. බටහිර රටවල උත්සුකය ප්‍රජාතන්ත්‍රවාදය ගැන නොව, යෙල්ට්සින් යටතේ කුනුකොල්ලයට විකුනා දැමූ රුසියාවේ සම්පත්වලට අත ගසා ගැනීමට ය. එවන් කොල්ලකාරී කතිපයාධිකාරීන්ගේ ධනය වෙනුවෙන් පෙනී සිටිමින් ඒවා ආරක්ෂා කල පුටින් සම්බන්ධයෙන් ගත් විට ඔහුගේ ක්‍රියා මාර්ගය යොමු වූයේ ඔවුන්ට එරෙහිව නොව, භූලෝපායික සම්පත් විදේශීය බලවේගයන්ට විකුනා දැමීමට එරෙහිව ය. රුසියානු රජය කොඩෝරොව්ස්කිට එරෙහිව මැදිහත් වන විට ඔහු, සිය ව්‍යවසායේ විශාල කොටස් ඇමරිකානු තෙල් සමාගම්වලට විකුනා දැමීමට සූදානම්ව සිටියේ ය.

එක්සත් ජනපදය, ඇෆ්ඝනිස්ථානු දඩ මීමා කරගෙන මධ්‍යම ආසියාව තුලට කා වැදීම මෙන් ම බටහිර රටවල්, ජෝර්ජියාවේ හා යුක්රේනයේ "විප්ලවයන්" දිරිමත් කිරීම මුල් කරගෙන ආතතීන් පැන නැගී තිබුනි. අතිශය වැදගත් ගෑස් නිෂ්පාදකයන් දිගුකාලීන කොන්ත්‍රාත්තුවලට බැඳ දැමීම මගින් රුසියාවට, මෙම කලාපයේ තුල බලපෑම යලි අත්කර ගත හැකි විය. කලාපය තුල ගෑස් අවශේෂ ලෝක වෙලඳපොලට අපනයනය කලේ ගෑස්ප්‍රොම් මගිනි. ඊට අමතරව, ඉරානය හා පකිස්ථානය සිය අවසාන රැස්වීමට කැඳවා ගත්, සහයෝගිතාවය සඳහා වූ ෂැංහයි සංවිධානයේ (එස්සීඑම්) රූපයෙන් මොස්කෝව, කිර්ගිස්ථානය, කසාක්ස්ථානය හා උස්බෙකිස්ථානය සමග නව හවුලක් ගොඩ නගනු ලැබුනි.

රුසියාව පසු ගිය වසර අවසානයේ දී හදිසියේ ම යුක්රේනයට කෙරෙන සිය ගෑස් අපනයනයන්ගේ මිල ගනන් ලෝක වෙලඳ පොලේ මට්ටමට ඉහල නංවමින් කෙටි කලකට සිය සැපයුම් අත් හිටුවීමත් සමග ම බටහිර අගනුවරවල අනතුරු ඇඟවීම් සීනු නාද විය. යුරෝපයට කෙරෙන ගෑස් සැපයුම් කෙරෙහි මෙම පියවරෙහි බලපෑම සීමිත වූ නමුදු එය පොදුවේ අර්ථ දක්වනු ලැබුවේ, දේශපාලන ලීවරයක් ලෙස තෙල් හා ගෑස් යොදා ගැනීමේ රුසියානු සූදානම සනාථ කිරීමක් ලෙස ය. එතැන් පටන්, රුසියානු සැපයුම් මත ඕනෑවට වඩා රඳා පැවතීම සලකනු ලැබුවේ ප්‍රධාන භූ-භූලෝපායික අවාසියක් ලෙස ය.

බටහිරට ඒ සමානව ම අනතුරු ඇඟවීමක් වූයේ, මෙම වසරේ මාර්තු මස පුටින්ගේ පීකිං සංචාරයේ දී ඔහු, බටහිර සයිබීරියානු භූමියේ සිට චීනයට ගෑස් නල මාර්ගයක් ඉදි කිරීමේ සැලසුම්, හදිස්සියේ ම වාගේ ප්‍රකාශයට පත් කිරීමයි. ඒ වන තෙක් ම සලකනු ලැබුවේ, බටහිර සයිබීරියානු බිම් රුසියානු හා යුරෝපීය පරිභෝජනය සඳහා පවතින බවත්, නැගෙනහිර සයිබීරියාවේ නව තෙල් බිම් චීනයට සැපයීම සඳහා

විවෘතවනු ඇති බවත් ය. බටහිර සයිබීරියාව තෙක් ගෑස් නල මාර්ගය සැබැවින්ම ගොඩ නගනු ලැබුවහොත්, රුසියානු සැපයුම්කරුවාගේ හස්තය සැලකිය යුතු තරම් ශක්තිමත් කරන තත්වයක් හමුවේ යුරෝපය තරගකාරී ගනුදෙනුකරුවෙක් ලෙස චීනයට මුනගැසෙනු ඇත.

යුක්රේනයට ගෑස් සැපයීම ගෑස්ප්‍රොම් විසින් අත්හිටුවීමේ තැන් පටන්, එක් අතකින් එක්සත් ජනපදය හා යුරෝපය අතරත් අනෙක් අතින් රුසියාව අතරත් සම්බන්ධතාවන් සැලකිය යුතු තරමින් නොරිස්සුම් සහගත වී තිබේ. පුටින්ට එරෙහි ප්‍රචාරක ව්‍යාපාරයේ හඬ දැඩි හා කර්කෂ වී ඇත.

මෙයට ප්‍රතිචාර ලෙස පුටින් තමාගේ ම ප්‍රචාරක ව්‍යාපාරය ආරම්භ කර තිබේ. ඔහු මොස්කව්හි පැවැත්වූ, ජාතික අනුග්‍රාහකත්වයෙන් යුත් රාජ්‍ය නොවන සංවිධානවල සමුලුවට සහභාගි වූ අතර, විවේචනයන් පවා නැගීමට අවසර ලබා දුන්නේ ය. ඉන් පසුව ඔහු, ජාත්‍යන්තර මාර්ගගත සමුලුවක් අවස්ථාවේ දී ප්‍රශ්නවලට පිලිතුරු සැපයූ අතර, "අන්තවාදයට" එරෙහිව සටන්වැදීම සඳහා රටවල් 49ක ආගමික නියෝජිතයන්ගේ තෙදිනක සමුලුවක් සංවිධානය කලේ ය. ජී-8 සමුලුවට ඔහු "ගෝලීය බල ශක්ති ආරක්ෂාව" සඳහා යෝජනාවක් ඉදිරිපත් කලේ ය. පුටින්ට අනුව එහි අරමුන පරිසරයට සිදුවන හානි අවම කර ගනිමින්, ලෝක ජනතාවට හා ගෝලීය ආර්ථිකයට දැරිය හැකි මිල ගනන් යටතේ බල ශක්ති සම්පත් වෙත පිවිසීම සහතික කිරීම" ය. කෙසේ වුව ද, බලශක්ති පාරිභෝජික රටවල් පුටින්ගේ යෝජනාව සලකනු ලැබුවේ ට්‍රෝජන් අශ්වයෙකු ලෙස ය. ඔවුන්ගේ අදහසට අනුව මෙහි එල්ලය වන්නේ, මහා බලවතුන්ගේ දේශපාලනය තුල තීරනාත්මක සාධකයක් බවට රුසියාව පත් කරන, ගෝලීය බල ශක්ති වෙලඳපොලේ තීරකවරයා ලෙස එහි ක්‍රියා කලාපය සහතික කර ගැනීමයි.

විදේශ ප්‍රතිපත්ති පිලිබඳ එක්සත් ජනපදයේ අර්ධ නිල බුද්ධි මන්ඩලයක් වන විදේශ සම්බන්ධතා කවුන්සිලය විසංවාදී අවශ්‍යතාවන් මෙසේ සාරාංශගත කලේ ය. "එලඹෙන කාලය සඳහා එක්සත් ජනපදයේ ඉලක්කය වන්නේ මැද පෙරදිග මත අපගේ රඳාපැවැත්ම අවම කර ගැනීම යි. යුරෝපීයයන් සඳහා නම් ඉලක්කය වන්නේ, රුසියාව බලශක්ති අපනයන් මත ඔවුන්ගේ රඳාපැවැත්ම අවම කිරීම හා විවිධාංගීකරනයයි. බලශක්ති ආරක්ෂාව පිලිබඳව රුසියාවට ඇත්තේ වෙනත් දෘෂ්ටියකි. රුසියාවට සිය තෙල් සහ ගෑස් සඳහා ඉල්ලුමේ බන්ධතාවය සහතික කර ගැනීම අවශ්‍ය ය. එබැවින් රුසියාවට අවශ්‍යවන්නේ ලෝක බලශක්ති වෙලඳපොලවල සිය තත්වය මහා බලවතෙකු වීමේ මාවත ලෙස යොදාගැනීමට යි. එසේ කිරීමේ දී එය සතු ලීවරය දේශපාලන මං සඳහා පාවිච්චි කිරීමට ඇල්මක් දක්වයි."

## ඉරානය

ඉරාන පාලන තන්ත්‍රයට එරෙහි පියවරයන්ට මොස්කව් හි සහයෝගය ලබා ගැනීම් වස් වොෂින්ටනය යොදන පීඩනය ක්‍රමානුකූලව ඉහල නංවා ඇත. සමුලුවට දින දහයකට පෙරාතුව ජනාධිපති බුෂ් කැපීපෙනෙන ලෙසින්, එක්සත් ජනපද හිතවාදී ජෝර්ජියානු නායකයාට ධවල මන්දිරයට ආරාධනය කලේ ය. මෙය පැහැදිලිව ම ඇඟවුම් කලේ කෝකසස්හි මොස්කෝවේ උත්සුකයන්ට එරෙහි තර්ජනයකි.

ඉරාක මිලිටරි මරාලයේ දර්ශනය හමුවේ, වොෂින්ටනය පෙර නොවූ විරූ විවෘත භාවයකින් එක්සත් ජනපදයට ගැලපෙන පරිදි පාලන තන්ත්‍රය වෙනස් කිරීම සඳහා අසල්වැසි රාජ්‍යයන් මත, රාජ්‍යතාන්ත්‍රික හා ඇතැම්විට මිලිටරි පීඩනය උග්‍ර ලෙස ක්‍රියාවට නගමින් සිටියි. යුරෝපීය සහයෝගය ද ඇතිව එක්සත් ජනපදය, ඉරානය මත පීඩනය දැඩි කරමින් සිටින අතර ඊස්‍රායලය, ඇමරිකානු පිටුබලය සහිතව සිරියාවට තර්ජනය කරමින්, හමාස් නායකත්වයෙන් යුත් පලස්තීන අධිකාරිය බිඳ දැමීමේ මිලිටරි ව්‍යායාමයක නිරතව සිටියි.

ඉරානය සම්බන්ධයෙන් ගත්කල රුසියාවට, බොහෝ දේ පරදුවට තැබීමට සිදුව තිබේ. දෙරට සමීප ආර්ථික සබඳතා පවත්වයි. ඉන්දියාව හා චීනයට පසුව ඉරානය, රුසියාවේ තෙවෙනි විශාලතම යුද්ධෝපකරන ගනුදෙනුකරුවා වන අතර ඇය තම බලශක්ති හා න්‍යෂ්ටික බල තාක්ෂනයේ විශාල කොටසක් රුසියාවෙන් ආනයනය කරයි.

සියල්ලටත් වඩා එක්සත් ජනපදය හා නේටෝව කැස්පියන් කලාපයෙන් ඉවත්කර තැබීමේ රුසියානු උත්සාහයේ දී ටෙහෙරානය, රුසියාවේ වැදගත් මූලෝපායික සහකරුවෙකි. ටෙහෙරානයේ මුල්ලා පාලන තන්ත්‍රය තමාගේ පැත්තෙන්, රුසියාව තුල ඉස්ලාමීය බලවේගයන්ට සහයෝගය දීමෙන් කැපීපෙනෙන ලෙස වැලකී සිටින අතර, චෙච්නියාවේ මුස්ලිම් ජනතාව සම්බන්ධයෙන් මොස්කෝවේ තිරස්චීන ප්‍රතිපත්තීන් පිලිබඳව නිහඬව සිටියි.

කෙසේ වුව ද, ටෙහෙරානය සමග මොස්කව්හි සන්ධානයට සීමාවන් පවතී. රුසියාව, ඉරානය ශක්තිමත් කලාපීය බලවතෙකු බවට පත් වීම ගැන හෝ න්‍යෂ්ටික අවි අත්කර ගැනීම ගැන කැමැත්තක් නොදක්වයි. එය කලාපය තුල තමන්ගේ ම අවශ්‍යතාවන්ට නොවැලැක්විය හැකි පරිදි බලපායි. කොයි අතින් බැලුවත් ඉරානය අතිශයින්ම අස්ථාවරය. වර්තමාන ඉස්ලාමීය පාලන තන්ත්‍රය තව දුරටත් පෙරලිකාරී වීම හෝ බටහිර මුල් බැසගත්

බලවේගයන්ගේ වාසියට හේතුවන පරිදි එම පාලනය පෙරලා දැමීම හෝ රුසියානු අවශ්‍යතාවන්ට තර්ජනයක් සේ සැලකෙයි.

2003 පෙබරවාරියේ දී ටෙහෙරානය, තමන් පූර්න න්‍යෂ්ටික ඉන්ධන චක්‍රයක් සංවර්ධනය කරන බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමත්, මෙම වසරේ ජනවාරියේ දී යුරේනියම් බලගැන්වීමේ පර්යේෂන යලි ඇරඹීමත් සමග, දෙරට අතර සබඳතාවන් කැපීපෙනෙන අයුරින් නොරිස්සුම් සහගත වී තිබේ.

මතභේදාත්මක න්‍යෂ්ටික ප්‍රශ්නය විසඳීමේ තමන්ගේ ම යෝජනා රුසියාවට ඉදිරිපත් කර තිබේ. එය, යුරේනියම් බලගැන්වීමට ටෙහෙරානයට අවසර දෙන්නේ ඉරාන-රුසියානු ඒකාබද්ධ ව්‍යවසායක සන්දර්භය තුල ය. අවම වසයෙන් මෙහි කොටසක් හෝ රුසියානු භූමියෙහි සිදු විය යුතු ය. යන කොන්දේසිය ඊට ඇතුලත් ය. ටෙහෙරානය මෙම යෝජනාව ප්‍රතික්ෂේප කල හොත්, ඉරානයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්බාධකවලට පක්ෂව රුසියාව ඡන්දය දිය හැකි ය. ශාක්ත පීටර්ස්බර්ග් හි භූ-දේශපාලන කඹ ඇදීමේ ක්‍රියාවලිය තුල රුසියාව, මෙම ප්‍රශ්නය යොදා ගැනීම නිසැක ය.

සඳුදා ප්‍රවෘත්ති වාර්තාවලට අනුව, ඉරානයට එරෙහි සම්බාධක කෙරෙහි මොස්කෝව සිය විරුද්ධත්වය ඉවත්කර ගන්නේ නම්, සිවිල් න්‍යෂ්ටික තාක්ෂනය පිලිබඳව අවසන් ස්වාවබෝධ ගිවිසුමකට වොෂින්ටනය, සිය සූදානම පලකලේ ය. ගිවිසුමට අනුව, වසරකට ඩොලර් බිලියන 20ක් තරම ගෙන එන ව්‍යාපාරයක් වන, විශාල ප්‍රමානයක ජාත්‍යන්තර න්‍යෂ්ටික අපද්‍රව්‍ය සයිබීරියාවේ තැන්පත් කිරීම සඳහා මොස්කෝවට ඉඩ සැලසෙනු ඇත. මේ තාක් දුරට දහනය වූ ඉන්ධන කූරු ඉවත දැමීම සඳහා වූ ජාත්‍යන්තර ගිවිසුම් අනුව, විභවාත්මක විකිරනශීලී අපද්‍රව්‍ය වෙලඳපොලෙන් දල වසයෙන් සියයට අනූපහක් පාලනය කරන්නේ එක්සත් ජනපදය යි.

අනෙකුත් වෙලඳ ගනුදෙනුවලට ද, නිදසුනක් ලෙස, වසර ගනනාවක් තිස්සේ වොෂිංටනය විසින් අවහිර කරගෙන සිටින ලෝක වෙලඳ සංවිධානයේ රුසියානු සාමාජිකත්වය සඳහා මෙයින් ඉඩ සැලසෙනු ඇත.

සාන්ත පීටර්ස්බර්ග් හි දී එලඹෙන්නා වූ ඕනෑ ම ගිවිසුමකින් සිදු වනු ඇත්තේ, සලකුනු කෙරී ඇති භූ-මූලෝපායික හා බලශක්ති ගැටුම් තාවකාලිකව ලිහිල් වීම පමනි. ඒවාට කැකෑරෙන ආතතීන් විසඳාලිය නොහැකි ය. වඩාත් වැදගත් ආර්ථික බලවතුන් හා ඉන්ධන පාරිභෝගිකයන් ගෙන් සමහරෙක්, එනම් චීනය, ඉන්දියාව, බ්‍රසීලය, මෙක්සිකෝව හා දකුනු අප්‍රිකාව, ජී-8 තුල නියෝජනය වූයේ හෝ නැත.

දිගුකාලයේ දී, සමුලුවට සූදානම් වීමේ කාලය තුල දක්නට ලැබුනු ඉමහත් ආතතීන්ගේ මුල් විහිදී ඇත්තේ, ධනවාදය පදනම් වන භූගෝලීය ආර්ථිකය හා ජාතික රාජ්‍ය පද්ධතිය අතර අසංගතභාවය තුල ය. ප්‍රථම හා දෙවන ලෝක සංග්‍රාමයන්ට පෙර කාල පරිච්ඡේදය තුල මෙම ආතතීන් වඩ වඩාත් පුපුරා ගියේ, පෘථිවිගෝලය නව ලෝක යුද්ධයක තර්ජනයට ඇද දමන බිහිසුනු ගැටුම්වල රූපයෙනි. ධනවාදය පෙරලා දමා, සමාජය, සමාජවාදී පදනමක යලි සංවිධානය කිරීමට කම්කරු පන්තිය අසමත් වීමේ ප්‍රතිඵලය වූයේ එය යි.

© www.wsws.org